# ශ්‍රී ලාංකේය භික්ෂුවගේ වත්මන් දේශපාලන ගමන්මග පිළිබඳ බෞද්ධ දෘෂ්ටි කෝණය

- කිරිමැටියාවේ ධම්මසිරි හිමි

මෙම පර්යේෂණය කිසියම් ගැඹුරු මූලාශ්‍ර පදනම් කොටගත් අධ්‍යයනයක් නොවේ. එහෙත් ඒ තුළින් මා පරීක්ෂා කිරීමට අපේක්ෂා කරනුයේ වත්මන් සමාජයේ බෝහෝ දෙනාගේ දැඩි කථාබහට ලක්වන හා ලක් වූ සිදුවීම් අතර භික්ෂුවගේ වත්මන් දේශපාලන ගමන් මග පිළිබඳව විමසා බැලීමය. මෙහිදී පර්යේෂකයාගේ ස්වාධීන අදහස් එකී භික්ෂු දේශපාලන ගමන් මග පිළිබඳව දක්වා ඇති බව සැලකිය යුතුය. භික්ෂුව යනු ස්වාධීන වූ කෙනෙකු නොවන අතර ඔහු එක්තරා ආයතනයක එක් චරිතයක් බවත්, එකී ආයතනය තුළ ඇති පොදු ලක්ෂණය නම් පෞද්ගලික බවින් වියුක්තව පොදු බව තහවුරු කරමින් නිවන් අරමුණු කොට ගනිමින් ධර්මය හා විනය මනාව ප්‍රගුණ කරමින් විමුක්තිය ගවේශනය කිරීමය. එහෙත් නූතනයේ භික්ෂුව ඉන් ඔබ්බට යන වෙනත් භූමිකා කරපින්නා ගනිමින් සංසාර විමුක්තිය පසෙක තබා බණ පොත ද ඉවත ලමින් යම්යම් දේශපාලන වාද අරමුණු කොට ඇදීයන ආකාරයක් දක්නට ලැබේ. ඔවුහු තම දේශපාලන අරමුණුවලට මෙන්ම ගමන් මගට මූල බීජ, සරු පස, පොහොර මෙන්ම අමුද්‍රව්‍ය ද ලාංකික ඉතිහාසයෙන්ම සපයා ගනියි. එහෙත් එවන් අරමුණක් වෙනුවෙන් භික්ෂුව ක්‍රියාකළ යුතු යැයි ධර්මය තුළින් හෝ විනය තුළින් හෝ සනාථ නොවන බව මම තරයේ විශ්වා කරමි. භික්ෂුවගේ දේශපාලන ගමන් මග පිළිබඳ කිසියම් විමර්ෂණයක්

කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ඒ සඳහා වත්මන් භික්ෂු දේශපාලන ක්‍රියා පිළිවෙත් මා යොදා ගනුයේ ද්වේෂයෙන් නොව ධර්ම සංවේගයෙන් බව සඳහන් කරමි.

## අතීත රජ්‍ය තන්ත්‍රය සහ භික්ෂුව අතර සබැදියාව

ලාංකීය සමාජ සන්දර්භය තුළ භික්ෂුව හා භික්ෂුවගේ ක්‍රියාකාරිත්වය ප්‍රබල සමාජ බලවේගයක් ගොඩනැගීමට සමත්ව ඇති ආකාරය එහි ඉතිහාසයෙන් තහවුරු වේ. එමෙන්ම ඔවුන්ගේ විශ්වාසය නම් තමන් මත සමස්ත සමාජ වගකීම් පැටවී ඇති බවත් එය මිහිඳු හිමියන්ගේ ලාංකීය ධර්ම දූත සංචාරය තුළින් නිර්මාණය වූ බවත් තහවුරු කරලීමය. මිහිඳු යුගය අප ඉතිහාසයේ නවමු පරිච්ඡේදයක් ලෙස සඳහන් කළ හැකි අතර එම යුගය ශ්‍රී ලාංකීය සමාජයේ එතෙක් පැවති ගමන් මග වෙනස් කිරීමට පවා සමත් විය. මිහිඳු යුගයෙන් පෝෂණය ලැබූ ජනතාව භික්ෂුව ස්වකීය ජීවිතයේ මුරදේවතාවා ලෙස පිළිගත් අතර ආගමික සාමාජික හා දේශපාලනික අවස්ථාවල දී පවා භික්ෂුවට මුල්තැන දී ක්‍රියා කිරීමට උත්සුක වූ අවස්ථා විරල නොවේ. ලාංකික ඉතිහාසයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය නම් ආගමත් දේශපාලනයත් අතර ඇති සුවිශේෂී සබැදියාවයි. ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ඉතිහාසයේ පටන් වර්තමානය තෙක් පැවත ආ යුගයන් පරීක්ෂා කර බලන විට පෙනියන්නේ ලාංකේය දේශපාලන භූමිකාව තුළ භික්ෂුව ගැලක කඩ ඇණය සේ ක්‍රියාත්මක වී ඇති ආකාරයකි. එහෙත් විටක එය වර්ණනා මුඛයෙන්ද තවත් විටක ජුගුප්සාවෙන්ද පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පාත්‍ර වී ඇත.

මහින්දා ගමනය සමග ලංකාවේ සිදු වූ නව සංස්කෘතික විප්ලවය විශේෂයෙන්ම ලාංකිකයන්ගේ නව දැනුම ආකල්ප හා කුසලතා ඔප්නැංවීමෙහි මූලික ප්‍රවේශය ලෙස හඳුනාගත හැකිය. මෙකී කරුණු ත්‍රිත්වය රාජ්‍ය සංවර්ධනයේ අඩිතාලම ලෙස හැඳින්විය හැකිය. මිහිඳු හිමියන් හඳුන්වා දුන් නව විප්ලවීය වෙනස නම් සියලු සමාජ ක්‍රියාකාරකම්වල මූලාකෘති බන්ධනය



බුදුසමය බවට පරිවර්තනය කිරීමය. එහි ප්‍රථම පියවර ලෙස මිහිඳු හිමියන්ගේ ධර්ම දූත යාත්‍රාවෙහි අර්ථය පැහැදිලි කළ යුතුය. උන්වහන්සේ රාජ්‍යත්වයේ පක්ෂ පාතිත්වය තමන් වෙතට නතුකොට ගනිමින් රාජ්‍ය සභිකයන් ඊට ඇදීම සඳහා දහම් දෙසා ඔවුන් පැවිදි කිරිමෙන්ද පසුව බුදුසමයේ චිරස්ථිතිය සඳහා රාජ්‍ය අනුග්‍රහයක් ලැබීමේ ඇති වටිනාකම ගැඹුරින් විමසා බැලීමක ප්‍රතිඵලයක් නිසා විය හැකිය. ඒ අනුව රාජ්‍යහිතවාදින් බුදුසමයෙන් ලැබූ ආභාසය සපුරාම රාජ්‍යත්ත්වය හෙවත් රාජ්‍යපාලනය කෙරේ බලපෑම් නොකළේ යැයි සිතීමට කිසිදු අවකාශයක් නොමැත. දෙවනපෑතිස් රජුගේ දෙවන රාජ්‍යාභිෂේකය බෞද්ධ ආගමික සංකල්පවලට මුල්තැන දෙමින් කිරිම තුළින් ගම්‍ය වන්නේ එය නොවිය හැකිද? විශේෂයෙන් දෙවනපෑතිස් රාජ්‍ය අවධියේ පටන් අතිබහුතර රාජ්‍ය පාලකයන් අතුරින් දේශිය උරුමය ඇති මෙන්ම නැති පිරිස් බෞද්ධයන් බවට පත්ව භික්ෂූන්ගේ උද්යෝගී දායකයන් බවට පත්වී ඇති ආකාරය ඉතිහාසයෙන් අනාවරණය වේ. විශේෂයෙන් රාජ්‍යාභිෂේක මංගල උත්සවය පවත්වන දිනයෙහි සංඝයාට මෙහෙ කිරිම සඳහා සුදු හිස්වෙළුම් ලා සංඝයා සඳහා විටෙක මෙහෙ කළ බව සඳහන් වේ. විටක අප දේශයේ රාජ්‍ය පාලනය සඳහා භික්ෂුව ඉතා ප්‍රබල දායකත්ත්වයක් දක්වා ඇත. විටක ඒ වෙනුවෙන් ඔවුන් ජනතා බලය පවා මෙහෙවුවා මෙන්ම ඒ සඳහා ස්වකීය ලේඛන කෞශල්‍යයද උපයෝගි කොට ගත් ආකාරය සිංහල රජකෙනෙකු හෝ වෙනත් කෙනෙකු රජවන්නේනම් ඔහු බෞද්ධයෙකු විය යුතු බව අනුරධපුරයුගයේ පැවති මතයක් බව බුද්දපාරින්ද නම් දෙමළ රජුගේ ලිපියෙන් සනාථ වේ. හතරවන මිහිඳු ලිපියේ සඳහන් වන පරිදි රජු බෞද්ධයෙකු පමණක් නොව බෝධිසත්ත්ව වරයෙකු ද විය යුතු බවත් බෝධි සත්ත්වයන් හැර අන්කිසිවෙකු රජ නොවන බවත් සනාථ කොට ඇත. ''මෙ සිරිලක්හි නොබොසත්හු නොරජ්වන්හයි සැහැකුල කොත් සවනිය මුනිරජ්හු වියරණ ලද්'' *(ගුණවර්ධන, රණවීර, සිවුර සහ නගුල, පිටුව: 175)* ක්‍රි:ව 10 වන ශතවර්ෂය වනවිට මෙම පිළිගැනීම කොතරම් ප්‍රබල වී ද යත්

ලංකාවේ රජු බෞද්ධයෙකු පමණක් නොව බෝධි සත්ත්වයෙකු ද විය යුතු ය යන පිළිගැනීමෙන් තහවුරු වේ.

තවද රාජ්‍යත්ත්වය භික්ෂුව විසින් පිරිනමන ලද්දක් ය යන මතයද අනුරාධපුර යුගයේ පැවති බවට අභයගිරි විහාර ලිපිය සාක්ෂි දරයි. පූජාවලියෙහි සඳහන් ආකාරයට"එහෙයින් මේ ලක්දිව තුණුරුවන්ගේ භාණ්ඩාගාරයක් වන්න. එසේ හෙයින් මේ ලක්දිව මිත්‍යාදෘෂ්ටි ගත්තවුන්ගේ වාසය නම් පෙර යක්ෂයින්ගේ වාසය ස්ථිර නොවූවාසේ ස්ථිර නොවන්නේමය. මිථ්‍යාදෘෂ්ටිගත් රජෙක් ලක්දිව බලහත්කාරයෙන් කිසි කලෙක රාජ්‍ය කළේ වී නමුත් ඔවුන්ගේ වංශ ප්‍රතිෂ්ඨා නොවනු බුදුන්ගේ ආනුභාව විශේෂයක්මය. එසේ හෙයින් මේ ලක්දිව සම්‍යක් දෘෂ්ටික රජවරුන්ටම සීහෙන හෙයින් උන්ගේ කුල ප්‍රවේණිය පවතින්නේද ඒකාන්තමය" *(පූජාවලිය, පිටුව: 48)* තවද ක්‍රි:පූ තුන්වන සියවසට හා ක්‍රි:ව දෙවන සියවසට අයත් සෙල්ලිපිවලින් තහවුරු වනුයේ බුදුසමය වනාහි තම්බපණ්ණි දීපයෙහි ජාත කුල පුත්‍රයන්ගේ ආගම වූ ආකාරයයි. වෙනත් අයුරකින් කිවහොත් එය ජාතික ආගම විය. ජාතියත් ආගමත් දෙකක් නොව එකක්ම වීම මින් පෙනීයයි.

ලංකාවේ රාජ්‍ය සංස්ථාව විකාශනය වූ ආකාරය හා ක්‍රියාත්මක වූ ආකාරය අනුව පෙනෙන්නේ එය මහජන අනුමැතිය හා සහයෝගය මත සිදු වූ ආකාරයකි. එනිසාම පාහේ ඉතිහාසය මුළුල්ලේම රජකම හිමිවීම සම්බන්ධයෙන් බලපෑ නීති පද්ධතියෙන් ප්‍රථම නීතිය වූයේ මෙරට පාලකයා අනිවාර්යයෙන්ම බෞද්ධයෙකු විය යුතු බවකි. මෙහි ආරම්භක අවස්ථාව ලෙස මිහිඳු හිමියන් දෙවනපෑතිස් රජුගේ ඉල්ලීම පරිදි අනුරාධපුර නගරය ඇතුළත් කොට සීමා පිහිට වූ අවස්ථාව දැක්විය හැකිය. වල්පොල රාහුල හිමියන්ගේ විග්‍රහයට අනුව මෙම අවස්ථාව බුද්ධනීතිය ලංකාවේ රාජ්‍ය පාලන නීතියේ අනුල්ලංඝනීය වූ කොටසක් වූ බවක සටහනක් බවයි. මේ තුළින් පෙනි යන්නේ බුදුසමය හුදු ලාංකීය ජනතාවට ආගමක්ම පමණක් නොව එදිනෙදා ජීවිතය කෙරෙහි බලපෑ සමාජ නීති



පද්ධතිය මෙන්ම රාජ්‍යය හා පුරවැසියන් අතර සම්බන්ධය ගොඩ නැංවීමට බලපෑ හරපද්ධතිය ද වූ බවකි. මින් පෙනී යන්නේ රාජ්‍ය පරිපාලන නීති පද්ධතියේ හැඩ ගැසීම හා පැවැත්ම කෙරෙහි බුදුසමය සුවිශේෂී බලපෑමක් ඇති කළ ආකාරයකි. බුදුසමයට එරෙහිව පාලන රටාව ගෙන යෑමට යමෙකු කටයුතු කරන්නේ නම් ඔවුනට එරෙහි වීමට බෞද්ධයන් පසුබට නොවූ බව ඉතිහාසය සාක්ෂි දක්වයි. ලාංකික බෞද්ධයාගේ මූලික අපේක්ෂාව නම් රජු බුද්ධ ශාසනයේ ආරක්ෂකයා හැටියට පිළිගැනීමයි. සේන හා ගුත්තික පාලන අවධිය සටහන් කරණ මහාවංශ කතුවරයා පෙන්වා දෙනුයේ අවුරුදු 22 ක් මොවුන් දෙදනා ධර්මයෙන් රාජ්‍ය කළ බවකි. එළාර රාජ්‍ය අවධිය එවන් යුගයක සටහනක් ද සනිටුහන් කරයි. එළාර පාලනයට එරෙහි ව දුටුගැමුණු රජුගේ යුධ ක්‍රියා වලිය සඳහා බොහෝවිට බෞද්ධ පිරිස් පෙළ ගැසෙන්නට ඇත්තේ දෙශීය ජන්මයකට උරුම කම් ඇති පාලකයෙකුගේ අවශ්‍යතාව නිසා විය හැකිය.

මන්ද යත් එළාර වර්ෂ 44 ක් ධාර්මිකව රජ කළ බව මහාවංශයෙන් සනාථ වේ. භික්ෂූන් දුටුගැමුණු රජුගේ යුධ ක්‍රියාවලියේ පෙර ගමන් කරුවන් බවට පත්වීම තුළින් පෙනීයන්නේ රාජ පරිපාලන රටාව තුළ භික්ෂුව සඳහා පැවති බලය නොවේ ද? විටක භික්ෂුව අනාගතයේ රජ වන තැනැත්තාට ගුරු හරු කම් දෙමින් රජෙක් නිර්මාණය කිරීම සඳහා ගත් වෙහෙස ධාතුසේන හා වළගම්බා යුගයෙන්ද තහවුරු වේ. තවද, සිංහල රාජ්‍යත්ත්වයේ සංකේත ලෙස බුදුන් වහන්සේගේ ශාරීරික ධාතු කොටස් අත්‍යවශ්‍ය අංග බවට පරිවර්තනය කිරීම ආගම හා රාජ්‍ය අතර පැවතිය යුතු අන්‍යෝන්‍ය සබැඳියාව ගොඩ නැංවීමෙ සුවිශේෂි ලක්ෂණයක් ලෙස දැකිය හැකිය. මෙම සියලු ක්‍රියා දාමයන්හි ප්‍රධාන ගාමක බලවේගය වූයේ භික්ෂූන් වහන්සේ බව අප අමතක නොකළ යුතුය. ඒ අනුව අපට හතවුරු වනුයේ ක්‍රි:පූ 3වන ශතවර්ෂයේ සිට ක්‍රි:ව 19 ශතවර්ෂයේ සිංහල රාජ්‍ය අභාවයට ගිය දිනෙකත් ලංකා රාජ්‍යයට නිතියෙන් බලය ලැබුණේ බෞද්ධයෙකුට පමණ බවත් බුදුසමය භික්ෂුව හා රාජ්‍ය යන ආයතන තුන එක් හුයක්

මෙන් පැවති ආකාරයත් එය බිඳී ගිය විට දිවි හිමියෙන් එය නගා සිටුවීමට ගත් වෙහෙසකි.

## භික්ෂුව හා වත්මන් දේශපාලනය

උක්ත තොරතුරු තුළින් පෙනීයන්නේ ලංකා ඉතිහාසයේ විවිධ වකවානුවල භික්ෂුව හා දේශපාලනය අතර ප්‍රබල බැඳීමක් දැකිය හැකි ආකාරයකි. එහෙත් විටක එය භික්ෂුව හා භික්ෂු සංස්ථාවට අභියෝගයක් ලෙසද හඳුනා ගතහැකිය. නිදසුන් ලෙස මහසෙන් රාජ්‍යසමය මහාවිහාරය විනාශ වීම ද වළගම්බා රාජ්‍ය සමයේ භික්ෂු සංස්ථාව දෙකට බෙදීයෑම ද නිදසුන් ලෙස දැක්විය හැකිය. භික්ෂුවගේ දේශපාලනය ගමන් මග ඉතිහාසයෙන් අනාවරණය වන ආකාරයට වඩා කිසියම් සෝදාපාලුවකට ලක්ව ඇති ආකාරය වර්තමාන භික්ෂු දේශපාලන රටාවෙන් තහවුරු කොට ගත හැකිය.

විශේෂයෙන්ම 1815 දී පාලකයන් විසින් ඇතිකරගත් උඩරට ගිවිසුම පෙර නොවූ විරූලෙස සිංහල ජාතියට ආගමට හා ඔවුන්ගේ සංස්කෘතියට අභියෝග රාශියක් එල්ල කරන්නට විය. හිරු නොබසින අධිරාජ්‍යයක යටත් වැසියන් වූ අපි 1948 දක්වා දීර්ඝ කාලයක් තිස්සේ සංස්කෘතික පරිහානියෙන්ද බුද්ධි පරිහානියෙන්ද බැට කා අභිමානවත් නිදහසක උරුම කරුවෝ වීමු. තම ජාතිය හා ආගම නොසලකා හැරි ඉංග්‍රිසින්ට විරුද්ධව 1818 දී හා 1848 දී දියත් කළ කැරලි වලින් පෙනීයන්නේ ලාංකිකයන්ගේ හදවතට බුදුසමයේ අවශ්‍යතාව ප්‍රබලව දැනුණ බවකි. නිදහසින් පසුව අතීතය ස්මරණය කළ ඇතමෙකු කල්පනා කරන්නට ඇත්තේ අප යළිදු මිහිඳු යුගයක් නිර්මාණය කරගත යුතු බවකි. මීට නිදසුන් ලෙස 1956 වැනි වකවානුවලදී පිහිටුවන ලද බෞද්ධ තොරතුරු පරීක්ෂණ වාර්තාව සඳහන් කළ හැකිය. එහි එක් ඉල්ලීමක් වූයේ යටත් විජිත සමයේදී බුදුසමයට සිදුවූ හානි සොයා බලා වාර්තාවක් සම්පාදනය කිරීමයි.

එහි දක්වා ඇති ආකාරයට බුදුසමය විධිමත්ව පැවතුනේ රට සිංහල රජවරු යටතේ පැවති සමයේදීය. අනුරපුර යුගය සිංහල



බෞද්ධයාගේ ස්වර්ණමය යුගය විය. බුදු සසුනේ පරිහානිය ඇතිවන්නේ දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ල වීම සමගය. අඳුරු යුගය ඇරඹෙන්නේ 1505 න් පසු යටත් විජිත කරණය සමගය. එය බුද්ධාගමේ අතපය බැඳ ලංකාව කුරුසයට භාරදුන් යුගය විය. නිදහස ලැබීමෙන් පසුව වුවද ඒ තත්ත්වයෙ වෙනසක් වී නොමැති බව සටහන් කරන වාර්තාව නිගමනය කරනුයේ බුද්ධාගමට රාජ්‍ය අනුග්‍රහය ලබාදී 1815 ට පෙර පැවති තත්ත්වයට ගෙන යායුතු බවයි. *(Tambiah. S.J. Buddhism Betraid, පිටුව: 33-37)* විශේෂයෙන්ම වර්ෂ 133 පමණ කාලයක් පූර්ණ යටත් විජිතයක යටත් වැසියන් වූ අප එතරම් දුරාතීතයකට පුනරාගමනය කොට යළි ශිෂ්ටාචාරය ගොඩ නැගීම එහි අනාගතය සඳහා කෙතරම් උචිත දැයි දෙවරක් සිතා බැලිය යුතු නොවේද? මෙහි දී අප තේරුම් ගතයුතුව ඇත්තේ ගරා වැටුණු ශිෂ්ටාචාරය ආගම තුළින් ගොඩ නැංවීම ද? නැතහොත් නවීන දැනුම් පද්ධති තුළින් ගොඩ නැංවීම ද යන්න සිතා බැලිය යුතුය. කෙසේ වුවත්, ප්‍රබල භික්ෂු දේශපාලන ක්‍රියා කාරිත්වයක සටහන් අපට හමුවනුයේ නිදහසින් පසුව බව අප අමතක නොකළ යුතුය. බෞද්ධ තොරතුරු පරීක්ෂණ වාර්තාවෙන් පසු විවිධ භික්ෂු සංඝ සභා ඒකරාශී කොට එක්සත් භික්ෂු පෙරමුණ පිහිටුවා හේන්පිටගෙදර ඥානසීහ, බද්දේගම විමලවංශ, කොටහේනේ පඤ්ඤාකිත්ති, හැවැන්පොළ රතනසාර වැනි භික්ෂු පිරිස් එහි කැපී පෙනෙන චරිත ලෙස ක්‍රියා කළහ.

1940 දශකයේ අගභාගයේ පටන් බෞද්ධ භික්ෂුව පක්ෂ දේශපාලන ක්‍රමයට අවතීර්ණ වේ. 1956 දී පැවති මැතිවරණයට ආගමත් භාෂාවත් මුල්කොට ගනිමින් භික්ෂූහු ප්‍රබල දේශපාලන ක්‍රියාකාරී පිරිසක් ලෙස කටයුතු කළහ. මෙම මැතිවරණය පිළිබඳව අදහස් දක්වන හාර්වඩ් රිගින්ස් මෙම මැතිවරණය සාම්ප්‍රදායික මැතිවරණ රාමුවෙන් වෙන්ව රට ජාතිය ආගම වෙනුවෙන් දුෂ්ටයාත් ධාර්මිෂ්ටයාත් අතර සටනක් කරන්නට බෞද්ධ භික්ෂූන් වහන්සේලා සමත් වූහ. ***(අයිවන් වික්ටර්, පන්සලේ විප්ලවය, පිටුව: 1998)*** භික්ෂූන් ක්‍රමයෙන් ගලා ආ ලාංකීය භික්ෂුවගේ දේශපාලන. භූමිකාව 2004 වර්ෂයේ සිට

මැතිවරණ සඳහා ඉදිරිපත්වීමේ ව්‍යාපාරයක් දක්වා ගමන් කරයි. ලංකාව පුරා භික්ෂු දේශපාලන අපේක්ෂකයෝ 210 ආගමික වතට මුල්තැන දෙමින් වාද විවාද මැද දේශපාලන වේදිකාවට ''ජාතික හෙළ උරුමය'' ලෙස අවතීර්ණ වෙතත්, ඒ සඳහා මෙතෙක් නොදක්ක ආගමික සංකේත යොදා ගනු ලබයි. පැරණි රාජ්‍ය තන්ත්‍රය භාවිත කළ 'සංඛය' සංකේතය බවට පත්කරගත් ඔවුහු අතීත විභූතිය තුළින් වර්තමානය ගොඩනැංවීමේ සටනක යෙදෙන අතර දින 48ක මැතිවරණ සටනකින් පසුව පාර්ලිමෙන්තු ආසන 09 හිමි කරගනිති. ඒ අනුව ලාංකීය දේශපාලන ඉතිහාසයේ තුන් වන දේශපාලන බලවේගය ලෙස ''ජාතික හෙළ උරුමය'' අභිෂේක ලබයි. ඔවුහු ප්‍රතිපත්ති 10 ඉදිරිපත් කරත්. ඒ අනුව ආගම් සහා ඇදහිලි, රාජ්‍යයේ ආරක්ෂාව, ජාතික අයිතිය, රාජ්‍ය පරිපාලනය, සංවර්ධන රටාව, ආර්ථිකය, සමාජය, අධ්‍යාපන ක්‍රමය සහ මාධ්‍ය ප්‍රතිපත්තිය, රාජ්‍ය තුළ භික්ෂුව, විදේශ ප්‍රතිපත්තිය ඊට ඇතුළත් වේ.

මෙම ප්‍රතිපත්ති දෙස බැලුවිට සැබවින්ම පෙනීයන්නේ ඉන් බොහෝ ඒවා පැරණි බෞද්ධ රාජ්‍යයන්හි තිබූ ප්‍රතිපත්ති මාලාවන් බවයි. ඔවුන් පාර්ලිමේන්තු වරම් ලබා වසර හතරක් ඉක්ම ගොස් ඇතත් ප්‍රතිපත්ති මගින් බලාපොරොත්තු වූ සමාජ වෙනස තවම සිදුකළ නොහැකිවී ඇති ආකාරයක් දක්නට ලැබේ. එහෙත් ඔවුහු බෞද්ධාගම වෙනුවෙන් කිසියම් හඬක් අවදි කිරීමට සමත්වූහ. නිදසුනක් ලෙස ඕමල්පේ සෝභිත හිමි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බලහත්කාරයෙන් ආගමට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත එක් අවස්ථාවකි. විශේෂයෙන් ආණ්ඩුව එවැනි පියවරකට පොළඹවනු ලැබුවේ ජාතික හෙළ උරුමයේ ක්‍රියාකාරිත්වයයි. තම පක්ෂ ප්‍රතිපත්ති මත පදනම් වෙමින් ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධව ආණ්ඩුවේ තීරණවලට හෙළ උරුමය විවිධ බලපෑම් ඇතිකළේය. නිදසුන් ලෙස මෑත කාලයේ කතාබහට ලක්වූ අන්තර්වාර පාලන මණ්ඩලය, ඒකාබද්ධ යාන්ත්‍රණය ඇති කිරීම, ආදියට එරෙහිව එම පක්ෂය යම් යම් ක්‍රියාමාර්ග ගන්නට විය. ඒ සඳහා පුවත්පත්



සාකච්ඡා, අධිෂ්ඨාන පූජා සහ උපවාස ආදී වූ විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරමින් ඊට විරුද්ධව ජනතා බලයද පෙළ ගැස්වීය.

අප මෙහිදී සිහිපත් කළ යුතු කරුණ නම් අප දන්නා ඉතිහාසයේ මෙතෙක් පාලකයෙක් නොකළ ප්‍රකාශනයක් නම් තෙරුවන් සරණයි කියන ජනාධිපති වරයෙකු හා කථා නායක වරයෙකු බිහිකිරීමට පවා ඔවුන්ගේ පෙළ ගැස්ම ඉවහල් වූ බවයි. මෙලෙස ඔවුන් රජයට කිසියම් බලපෑමක් එල්ල කිරීමට සමත් වුවද ඔවුන් සඳහා එල්ල වූ ප්‍රබල විරෝධය නම් දේශපාලනය පිළිබඳ හයක් හතරක් නොදත් ''අහසින් පාත්වූ පිරිසක්'' යන්නය. එහි ද කිසියම් සත්‍යයක් ඇතිබව උඩුවේ ධම්මාලෝක හා කොළොන්නාවේ සුමංගල හිමිවරුන්ගේ දේශපාලන ක්‍රියා කාරිත්වයෙන් පෙනී ගියේය. එහෙත් විශ්වවිද්‍යාල දේශපාලන චින්තනයෙන් පන්නරය ලබාගත් අතුරලියේ රතන හිමියෝ එම පක්ෂයේ ප්‍රබල ක්‍රියා කාරි චරිතයකට උරුම කියති. පසුව තම දේශපාලන සගයා වන චම්පික රණවක සමග අත්බැඳ සිහළ උරුමය නමින් නව පක්ෂයක් බිහිකිරීමට ඔහු මූලික විය. කෙටි දේශපාලන ආයු කාලයක් ගෙවූ ජාතික හෙළ උරුමය, එවැනි කෙටි කාලයක් තුළ වැඩිම අභ්‍යන්තර අර්බුද රාශියකට මුහුණදුන් දේශපාලන පක්ෂයයැයි හැඳින්වීමද සාවද්‍ය නොවේ. ඒ කෙසේ වුවද, පක්ෂය ආරම්භයේ සිටම විවිධ අභ්‍යන්තර අර්බුදවලට මුහුණු දෙන්නට සිදුවිය. එම අර්බුද පිටතට නෙරා එන්නේ 13 වන පාර්ලිමේන්තු කතානායක වරයා තෝරා පත් කර ගැනීමේ ඡන්දයත් සමගය. එහිදී සැබවින්ම සිදුවන්නේ එකම පක්ෂයක මන්ත්‍රීවරු දෙපිරිසක් දෙයාකාර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමය, එය ලාංකේය භික්ෂු දේශපාලනය තුළ ප්‍රබලව කතාබහට ලක්වූ සිද්ධියක් විය. ජාතික හෙළ උරුමයේ මීළඟ අර්බුදය මතු වන්නේ තිලක් කරුණාරත්න සමගයි. ඔහුට ප්‍රමාණවත් තනතුරක් පක්ෂයෙන් නොලැබීම නිසා එක්සත් ජතික පක්ෂය සමග අත්වැල් බැඳගන්නේ පැරණි දේශාභිමානී සටන් පාඨ අමතක කරමිනි. අනතුරුව හෙළ උරුමයේ ජනප්‍රියම චරිත දෙක වන උඩුවේ ධම්මාලෝක හා කොළොන්නාවේ සුමංගල හිමිවරුන් පක්ෂයෙන් ඉවත්වන්නේ ධර්ම රාජ්‍යයක සංකල්පය

හුදු යුටෝපියාවක් බව පසත් කරමින්දෝ යන සැකය මා තුළ අදත් පවතී.

කොළොන්නාවේ හිමියන් දේශපාලනයෙන්ම සමුගත් අතර උඩුවේ හිමියන් ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස පෙනී සිටියේය. කෙසේ වෙතත්, පක්ෂයේ ගාමක බලවේගයක් වන පාඨලී චම්පික රණවක මහතාගේ මැදිහත් වීමෙන් පසුකාලය වන විට පක්ෂය තුළ යම් එකඟතාවක් ඇති වූ බව පෙනෙන්නට විය. කෙසේ වුවද, භික්ෂු දේශපාලන චාරිකාව පිළිබඳ මාගේ හැඟීම වනාහි භික්ෂුව දේශපාලනයට පිවිසීම සන්දර්භ පටලවාගෙන තම වගකීම වැරදිව වටහාගැනීමේ ප්‍රතිඵලයක් ලෙසය යන්නය. භික්ෂූන්ගේ මෙම දේශපාලන ගමනේ සුවිශේෂී සන්ධිස්ථානය අපට හමුවන්නේ පාර්ලිමෙන්තු ගර්භය තුළ දී ඔවුන් ගිහි දායක හෝ දායක නොවන මන්ත්‍රීන්ගෙන් පහරද කා රෝහල්ද ගතවෙමිනි *(රට පෙරට සඟරුවන රෝහලට, ඉරිදා දිවයින සංග්‍රහය: 2004: මැයි 13.)*

නමුත් භික්ෂූන්ගේ පාර්ලිමේන්තු චාරිකාව පිළිබඳ පැවති විද්වත් මතය නම් එතරම් සුභවාදී නොවීය. මෙම ප්‍රවේශය බෞද්ධ විනය මූලධර්මයන්ට අනුව විනය විරෝධී බව ඇතමුන්ගේ තර්කය විය *(මජිරසීහ හිමි කඹුරුගමුවේ, භික්ෂු විනය හා දේශපාලන පිටු: 95-100)* ඒ අතර බෙල්ලන්විල විමලරතන, ඉත්තෑපානේ ධම්මාලංකාර, කඹුරුගමුවේ වජිර වැනි යතිවරු ද මහාචාර්ය නලින් ද සිල්වා වැනි විද්වත්හු ද එම මතයෙහිම වූහ. තවද නලින් ද සිල්වා මහාචාර්යවරයා මෙය දකින්නේ පැවිද්දන් මතින් ගිහියන් පාර්ලිමේන්තුවට රිංගා ගන්නා මගඩියක් ලෙස ය. තවද පාර්ලිමේන්තුවට යෑම භික්ෂූන්ට කැප ද නැද් ද යන්න පිළිබඳව එතුමා දැක් වූ අදහස මෙසේය. පාර්ලිමේන්තුව භික්ෂූන් වහන්සේට කැප ද නැද් ද යන්න තීරණය කළ යුත්තේ සිංහල සම්ප්‍රදායට සාපේක්ෂවය. සිංහල බෞද්ධ සම්ප්‍රදායෙහි භික්ෂූන් රජුන් තැනූහ. එහෙත් රජ නොවූහ.



පාර්ලිමේන්තුව යනු රාජ්‍ය බලය ඇති මැති ඇමතිවරුන්ට භික්ෂූන් වහන්සේ අවවාද අනුශාසනා කිරීම සිංහල භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය වෙයි. එහෙත් එහි යෑම උන්වහන්සේට තරම් නොවේ. අද ඇතැමුන් කියන්නේ මැති ඇමතිවරුන් භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනාවලට කන් නොදෙන බැවින් උන්වහන්සේම මැති ඇමතිවරුන්ගේ කාර්යභාරය ද කළ යුත්තේ එයට හේතු කවරේදැයි සොයා බලා ඒ හේතු නැති කිරීමට ක්‍රියා කිරීම මිස තත්ත්වය තවත් අවුල් කිරීම නොවේ *(සිල්වා නලින් ද, මැතිවරණ සහ හාමුදුරුවෝ: පිටුව: 19.)* එහෙත් මේ පිළිබඳව ඇතමෙකු පක්ෂ වූ අතර ඇතමෙක් එරෙහි වූහ. එය කාලීන අවශ්‍යතාවක් යැයි කියූ ඇතමෙක් එය සාධාරණය ද කළේය. පසුව අපට පෙනීයන්නේ පර්ලිමේන්තුවට වැඩි භික්ෂූන් තම මන්ත්‍රීකම් ද අන් අයට පවරා ආරාමයට පුනරාගමනයෙකි. විටෙක බද්දේගම සමිත හිමියන්ගේ දේශපාලන ගමනෙහි ගුණාගුණ නොදිටි පිරිස් වෙනත් පාර්ශව භික්ෂූන්ගේ දොස් දුටුහ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තු භික්ෂුව බවට පත්වූ බද්දේගම සමිත හිමි වර්තමානයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරයි. කෙසේවෙතත්, කල්යත්ම ලාංකීය සමාජය තුළ භික්ෂුව සීඝ්‍රයෙන් දේශපාලනයට අවතීර්ණ වන ආකාරයක් දකිය හැකිය. නිදසුනක් ලෙස බත්තරමුල්ලේ සීලරතන හිමි 2011 වසරේ කොළඹ මහ නගර සභාවට ද, තරග කරයි. එක් අවස්ථාවක උන්වහන්සේ ජනාධිපතිවරණයට පවා තරග කොට ඇත. 2011 වර්ෂයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඇඹිලිපිටිය මහනගර සභාවට තරග කළ වේවැල්දූවේ ඥානප්‍රභ හිමි එම නගර සභාවට තරග කළ සියලු අපේක්ෂකයන්ට වඩා වැඩි මනාප ප්‍රමාණයක් ලබාගන්නා අතර උපවාසයෙකින් පසු නගරාධිපති හිමියන් බවට ද පත් වේ. ඒ අනුව 2011 වර්ෂය භික්ෂු දේශපාලන චාරිකාවෙ නව පෙරළියක් සිදුකළ වසරක් ලෙස හැඳින්විය හැකිය. භික්ෂූන්ගේ මෙම දේශපාලන ගමන පිළිබඳව කොටගොඩ ධම්මාවාස හිමියන් එක්තරා අවස්ථාවක ප්‍රකාශ කරනුයේ, "අද වන විට භික්ෂූන් වහන්සේලා දේශපාලන

ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙලා ශාසනයේ පිරිහීමක් ඇතිවෙලා තිබෙනවා. මේවා ගැන හොයල බලල ශාසනය නඟාසිටුවන්න යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යයි'' ***(භික්ෂූන් වහන්සේ දේශපාලනයට පිවිසීමෙන් බෞද්ධ ශාසනයේ පිරිහීමක් ඇතිව තිබෙනවා, දිවයින: 2011 ජූනි)*** එමෙන්ම බහුතර භික්ෂු මතය විමසුව හොත් භික්ෂූන්ගේ මෙම දේශපාලන ගමන පිළිබඳව ඇත්තේ භික්ෂූන් තුළ සුභවාදී ආකල්පයක් නොවන බව තරයේ සිහිපත් කරමි. එය භික්ෂූන් භික්ෂූන් සමග කලහ විවාද කර ගන්නා තෝතැන්නක් හෙවත් ගමන් මගක් බවට පරිවර්තනය නොවූවා යැයි කිව නොහැකිය.

## විමර්ශනය හා නිගමනය

වර්තමාන භික්ෂූන්ගේ දේශපාලන ගමන් මගෙහි පාඩම් සටහන් ඔවුන් සකසා ගනුයේ දීප වංශයත් මහා වංශයත් පූජාවලියත් ගිරිලිපි පුවරු ලිපි ආදීයත් ගුරුකොටගනිමිනි. එහෙත් බුද්ධ දේශනාව වනුයේ ධර්මයත් විනයත් තම ගුරුවරයා ලෙස සලකා අප්‍රමාදීව නිර්වාණාවබෝධය වෙනුවෙන් ක්‍රියා කරන ලෙසය. විශේෂයෙන්ම ප්‍රෞඪ බෞද්ධ සංස්කෘතියකට උරුම කම් ඇති බෞද්ධයෝ මිහිදු හිමියන්ගේ ආභාසයෙන් උරුම ලද්දෝ වූහ. මිහිඳු හිමියන්ගේ ධර්ම දූත ක්‍රියාවලිය තුළ පැහැදිළිව දැකිය හැක්කේ සංස්කෘතික පරිවර්තනයක් හරහා විමුක්තිගාමී දේශනා විලාසයකි. උන්වහන්සේ හඳුන්වා දුන් සංස්කෘතිය තුළ භික්ෂුව හා රජු අතර අන්‍යෝන්‍ය සබඳතාව ධර්ම සන්නිවේදනය සඳහා මිස රජුට පුරෝහිත කම් කිරීම සඳහා නොවේ. අරිට්ඨ ඇමති පැවිදි කොට විනය උගන්වා විනය දේශනාව පැවැත් වූවා මිස යළිත් රාජ්‍ය තන්ත්‍රය අතරට ඔහු එකතු වූවා නොව.

විශේෂයෙන්ම වර්තමානයේ දේශපාලන භූමිකාවෙහි නියුතු භික්ෂුව මිහිඳු හිමියන් හඳුන්වා දුන් සංස්කෘතියද පශ්චාත් කාලීන රචනාවන්ද සර්පයා බෙල්ලෙන් නොව වල්ගයෙන් අල්ලා ගත්තාසේ කිසියම් වැරදි දෘෂ්ටියකින් අල්ලා ගනිමින් නිවන්



අරමුණ කරගත් පැවිද්ද පසෙක ලමින්, දේශපාලනයෙන් භික්ෂුත්ත්වයට ගත හැකි පාඩම් සොයයි. සක්විති රාජ්‍යත්ත්වය අතහැරි බෝසතුන් ආරණ්‍යගතවෙද්දි නිවන් අරමුණු කරගත් පැවිද්දෝ දේශපාලන චාරිකාවෙහි යෙදෙත්. පුක්කුසාති හා මහකප්පින වැනි රජවරු රාජ්‍යත්ත්වය අතහරිද්දි පැවිද්දෝ ඒ වෙනුවෙන් උපවාස කරති, හඬති, නඬු කියති. මින් පෙනීයන්නේ භික්ෂූත්ත්වයේ සැබෑ අරමුණ ක්‍රමයෙන් ගිලිහී ඊට හාත්පසින් වෙනස් අපේක්ෂා ගොඩ නැගීමය. දේශපාලන චාරිකාවෙහි යෙදෙන භික්ෂුව බෝධිසත්ත්ව ලීලාවෙන් ඊට ප්‍රවේශ වුවද බෝධිසත්ත්ව පාරමිතා පිරූ බවක් හෝ පූරණ බවක් දැකිය නොහැකිය. විටෙක වාර්තා වනුයේ මන්ත්‍රී හිමියන් ද අල්ලස් ගත් බවකි. චුල්ල සීලය, මධ්‍යම සීලය හා මහා සීල පිරිය යුතු භික්ෂුව දේශපාලන කතාවෙන් පවා වෙන් විය යුතු බව බුද්ධ දේශනාවය. කෙසේ වුවද, ධර්ම මණ්ඩපයෙන් පාර්ලිමේන්තු මණ්ඩපයට වැඩි භික්ෂූන් මහාපරිනිබ්බාණ සූත්‍රයේ අන්තිම බුද්ධ වචනයට කළ සාධාරණය ප්‍රත්‍යවේක්ෂාවක් සේ සිහි කළ යුතු නොවේද? තවද බුදුන් වහන්සේ ලෞකික පරමාර්ථ කාම විතර්ක ලෙස ද ලෝකෝත්තර පරමාර්ථ කුසල් ලෙස ද අර්ථ දක්වමින් එකී කුසල පරමාර්ථ විමුක්ති සාධකයා ලෙස දක්වති. එය අමතක කොට වෙනත් අපේක්ෂා කර මතට ගත් නූතන දේශපාලන ගමන් මගෙහි පිය මනින භික්ෂුව මා අදහස් කරන අන්දමට කුමාර කස්සප හිමියන් පායාසි රජුට දුන් උපමාවට දෙවැනි නොවේ. ඌරන් ඇති කරන මිනිසෙක් ගමකට ගියේය. එහි දී අසූචි රාශියක් දැක ඉන් ටිකක් පොදි බැඳ හිස මත තබා ගෙණ යන්නේ මගදී වැස්සට අසුවිය. අසූචි දිය වී ඇඟ පුරා වැගිරිණි. එය දුටුවෝ 'මූ' පිස්සෙකැයි පරිභව කළහ.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත, (2004). රජයේ ප්‍රකාශන කාර්යාංශය, කොළඹ.

2. රණවක පාඨලී චම්පික, සිංහල අභියෝගය, (2001). දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ 10.

3. සාරානන්ද හිමි කහගල, ''ඉල්ලුමට සැපයුම න්‍යාය හා නූතන භික්ෂුවගේ කාර්යභාරය'' විදුරුවන ශාස්ත්‍රීය සංග්‍රහය, (2007). ඇපරලේ මංගල සංස්කරණය, හොරණ විශ්වවිද්‍යාපීඨය, හොරණ.

4. ''රට පෙරට සඟරුවන රෝහලට'' ඉරිදා දිවයින සංග්‍රහය, (2004). මැයි 13.

5. වජිරසිහ හිමි කඹුරුගමුවේ, භික්ෂු විනය හා දේශපාලන, (2007). කර්තෘ ප්‍රකාශනයකි.

6. සිල්වා නලින් ද, මැතිවරණ සහ හාමුදුරුවෝ, (2004). චින්තන පර්ෂදය.

7. සේනානායක කොලට්, කරුණාතිලක නාරද, ජවිපෙ, ශ්‍රීලනිප, එජාප සහ ක්‍රිස්තියානි මූලධර්මවාදය, (2004). බෝධි සභාව, උඩවෙල.

8. භික්ෂූන් වහන්සේ දේශපාලනයට පිවිසීමෙන් බෞද්ධ ශාසනයේ පිරිහීමක් ඇතිව තිබෙනවා, දිවයින, (2011). ජුනි 27.

9. පාර්ලිමේන්තුවට ගිය ගමන, රාවය, 2003 මාර්තු 03.

10. විජේසූරිය සරත්, 2009 ගරුතර සංඝ රත්නයෙන් අවසරයි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය. පුංචි බොරැල්ල.

11. අවසරයි හාමුදුරුවනේ, දිවයින, (2011) ජුලි 16.





12. රාහුල හිමි, වල්පොල, භික්ෂුවගේ උරුමය, (1999). ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

13. රාහුල හිමි, වල්පොල, ලක්දිව බුදුසමයේ ඉතිහාසය, (2009). එම්.ඩී ගුණසේන සහ සමාගම කොළඹ.

14. ගුණවර්ධන රණවීර, සිවුර සහ නගුල, (1993). සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, නාරාහේන්පිට, කොළඹ.

15. Bond D. George, The Buddhist Revival in Sri Lanka, (1988). Motilal Banarsidass, Delhi.